# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**විද්‍යුත් ප්‍රදර්ශණ පුවරුවක් (Digital Display Boards - LED) ස්ථාපිත කිරීම සහ**

**වෙළඳ ප්‍රචාරණ අයිතිය පැවරීම සඳහා**

**ආයතනයක් තෝරා ගැනීම**

**NTC/F&P/B.MW.LED/2025/219**


ජාතික ගමනා ගමන කොමිෂන් සභාව

අංක. 241

උද්‍යාන පාර

කොළඹ 05

info@ntc.gov.lk

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

බැස්ටියන් මාවත බස් පර්යන්තයේ විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව හරහා වෙළඳ ප්‍රචාරණ අයිතිය පැවරීමට අදාලව මිල ගණන් කැඳවීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන පිටකොටුව බැස්ටියන් මාවත මගී බස් පර්යන්තයේ දැනට පවතින විද්‍යුත් ප්‍රචාරණ ප්‍රදර්ශන පුවරුව (LED Panel) භාවිතයට ගැනීමට නොහැකි අතර එය ගලවා ඉවත් කිරීමට තිරණය වී ඇත.

එසේම මෙම පුවරුව සවිකර ඇති යකඩ ආධාරකය දැනට අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයක ඇත.

ඉහත කරුණු මත ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින්,

i. බැස්ටියන් මාවත බස් පර්යන්තයේ ස්ථාපිත විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවේ ආධාරක ව්‍යුහය අළුත් වැඩියා කර නව විද්‍යුත් ප්‍රදර්ශය පුවරුවක් ස්ථාපිත කිරීම.

හෝ

ii. බැස්ටියන් මාවත බස් පර්යන්තයේ ස්ථාපිත ප්‍රදර්ශන පුවරුව සහ ආධාරකය සම්පූර්ණයෙන් ඉවත් කර නව ආධාරකයක් සහිත විද්‍යාත් ප්‍රදර්ශන පුවරුවක් ස්ථාපිත කිරීම

සහ

මෙම පුවරුව හරහා වෙළඳ ප්‍රචාරණ අයිතිය වසර 05ක කාලයකට පැවරීමට අදාලව මිල ගණන් කැඳවනු ලැබේ.

මෙම විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවේ ප්‍රමාණය අවම අඩි 10 x 16 පමණ විය යුතුය.

මේ සඳහා උනන්දුවක් දක්වන ආයතනවලට, අදාළ විස්තර පත්‍රිකාව ජා.ග.කො.සභාවේ නිල වෙබ් අඩවිය www.ntc.gov.lk තුල බාගත කර ඇති අතර අදාල අයදුම්පත 2025/02/27 දින සිට 2025/03/17 දින දක්වා පෙ.ව 10:00 සිට ප.ව. 3:00 දක්වා ආපසු නොගෙවනු ලබන රු. **1500.00 මුදලක්, ගෙවීමෙන් ජා.ග.කො.ස. ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක.**

මුද්‍රා තබන ලද මිල ගණන් 2025/03/18 **දින ප.ව. 2:00** ට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. **එදිනම ප.ව. 2:00 ට ලංසු ලේඛන විවෘත කරන** අතර එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කළ අයට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතවරුන්ට සහභාගී විය හැක. වැඩිදුර විස්තර 011 2503969 යන අංකයෙන් ලබාගත හැකිය.

සභාපති

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

READ ONLY

# කොන්දේසි මාලාව

**කොන්ත්‍රාත් කාලය වසර 05කි**

1. තෝරාගන්නා ආයතනය මෙම ලංසු ලේඛණයේ සඳහන් කොන්දේසි සහ එකඟතා ඇතුලත් ගිවිසුමකට එළඹීම යුතුවේ.

2. විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවේ ආධාරක ව්‍යුහය අළුත් වැඩියා කර නව විද්‍යුත් ප්‍රදර්ශය පුවරුවක් ස්ථාපිත කිරිමේදී ඉවත් කරනු ලබන ප්‍රදර්ශන පුවරුව (LED පැනලය) ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත භාරදීම කල යුතුය. එමෙන්ම විද්‍යුත් දර්ශන පුවරුව සහ ආධාරකය සම්පුර්ණයෙන් ඉවත් කර නව ආධාරකයක් සහිත විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවක් ස්ථාපිත කිරිමේදී ඉවත් කරනු ලබන ප්‍රදර්ශන පුවරුව (LED පැනලය) සහ ආධාරකය ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත භාරදීම කල යුතුය.

3. විද්‍යුත් ප්‍රදර්ශන පුවරු තිරයේ මුළු ධාවන කාලයෙන් 50% ක් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තොරතුරු සහ දැනුවත් කිරීම් ප්‍රදර්ශණය සඳහා ලබා දිය යුතුය.

4. විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව සඳහා මාසිකව වැයවන විදුලි ඒකක ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා සුදුසු උපකරණයක් සවි කිරීම කළ යුතු අතර ඊට අදාල මාසික විදුලි ගාස්තු තෝරාගන්නා ආයතනය විසින් දැරිය යුතුවේ

5. මෙවැනි කාර්යයක් සාර්ථකව ඉටුකිරීම සඳහා අදාළ ආයතනය සතු තාක්ෂණික, මූල්‍යමය සම්පත්, මාධ්‍ය භාවිතය පිළිබඳ හැකියාව හා සුදුසුකම් සනාථ කළ යුතු අතර, අදාළ යෝජනාවලියට ඊට අදාළ සාක්ෂි ඇතුළත් කළ යුතුය.

6. දැන්වීම් ප්‍රචාරණය සඳහා තෝරාගන්නා ආයතනය සියලුම දැන්වීම්, ප්‍රචාරණයට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

7. තෝරා ගන්නා ආයතනය ජා.ග.කො.ස මගින් ලබාදෙන ධාවන කාලසටහන්/අනෙකුත් දත්ත ප්‍රචාරය කිරීමට බැදී සිටින අතර තම දත්ත වඩාත් නිර්මාණාත්මක හා යාවත්කාලීන ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව තෝරා ගන්නා දැන්වීම් ප්‍රචාරණ ආයතනයේ මුඛ්‍ය වගකීම විය යුතුය.



READ ONLY

8. අසභ්‍ය දර්ශන,මත්පැන් හා දුම්වැටි ප්‍රචාරණ දැන්වීම් සහ මාධ්‍ය සදාචාරයට පටහැනි දර්ශන ප්‍රදර්ශනය කිරිම සපුරා තහනම් වේ.

9. තෝරාගත් ආයතනය අදාල කොන්දේසි වලට පටහැනිව කටයුතු කළහොත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් පළමුව අවවාද කරන අතර මාස 01 ක් ඇතුළත සතුටුදායක ප්‍රගතියක් නොපෙන්වයි නම් සේවාව සැපයීම සඳහා නැවත යෝජනා කැඳවීම සිදු කරනු ලබයි.

- ආධාරක ව්‍යුහය සඳහා වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකුගේ සහතිකය
- විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව සඳහා සුදුසුකම් ලත් තාක්ෂණික ඉංජිනේරුවරයෙකුගේ සහතිකය

**10. ලංසු සුරක්ෂණය (Bid Security)**

සියලුම යෝජනා රු. 50,000.00 ක පිළිගතහැකි ලංසු සුරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය. ලංසු වලංගු කාලය ලංසු විවෘත කරන දින සිට මාස 03 කි. (දින 90ක්) ලංසු සුරක්ෂණයේ ආදර්ශයක් අමුණා ඇත. ඇමුණුම - 1)

**11. කාර්ය සාධන සුරක්ෂණය (Performance Security)**

තෝරාගත් ආයතනය කාර්ය සාධන සුරක්ෂණයක් ලෙස රු.300,000.00 ක ඇප මුදලක් තැන්පත් කළ යුතු අතර, අදාළ කාර්යය පැවරීමත් සමගම ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතුය.

12. මසකට ඉදිරිපත් කරන මුදල අනුව වැඩිම මුළු මුදලක් ඉදිරිපත් කරන ආයතනය තෝරා ගනු ඇත.

13. ටෙන්ඩරය සඳහා ඔබ ඉදිරිපත් කරන මුළු මුදල ඊළග මාසයේ 05 වන දිනට පෙර ගෙවිය යුතුය. මෙසේ මාස 03 ක කාලයක් ගෙවීම් පැහැර හරින්නේ නම් එය ගිවිසුම අහෝසිවීමට හේතුවක් වනු ඇත.

14. විද්‍යුත් ප්‍රදර්ශන පුවරු සඳහා සපයා ඇති විදුලිය සඳහා වන වියදම අදාල ආයතනය විසින් දැරිය යුතුය. මාස 02 කට වඩා විදුලි බිල්පත් නොගෙවන්නේ නම් , එය ගිවිසුම අහෝසිවීමට හේතු වනු ඇත.

**15. අදාළ මාධ්‍ය ආයතනය තෝරා ගැනීමෙන් පසුව යම් සාපරාධී ක්‍රියාවක් හෝ මාධ්‍ය සදාචාරයට පටහැනි යම් ක්‍රියාවක් සිදු කරයි නම් එවැනි ඕනෑම අවස්ථාවක අදාළ ගිවිසුම අවලංගු කිරීමේ පූර්ණ අයිතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතුය.**

READ ONLY

**තාක්ෂණික කොන්දේසි**

- නව පුවරුව කාලගුණ තත්ත්වයන් ඔරොත්තුදෙන විදුලිය පිරිමැසෙන සහ දුරස්ථව පාලනය කිරීමේ හැකියාවන්ගෙන් යුක්ත විය යුතුය.
- ආධාරක ව්‍යුහය සඳහා වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකුගේ සහතිකය
- විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව සඳහා සුදුසුකම් ලත් තාක්ෂණික ඉංජිනේරුවරයෙකුගේ සහතිකය
- පරිසරහිතකාමී අමුද්‍රව්‍ය සහ ගොඩනැගිලි ඉදිකිරීම් මාර්ගෝපදේශයන්ට යටත්ව සියලු ක්‍රියාකාරකම් සිදු විය යුතුය.

**අනුගතවීම සහ අනුමැතිය**

- රාජ්‍ය ආයතන සහ අධිකාරීන් මගින් දැන්වීම් පුවරු ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීමට සම්බන්ධව ප්‍රකාශයට පත් කර ඇති නීති සහ රෙගුලාසි වලට සහ ආරක්ෂක රෙගුලාසි වලට තෝරාගත් ආයතන අවනත විය යුතු වේ.

අදාළ ආයතනය යෝජනාවලිය සමග පහත ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**1. යෝජනාවලිය**

එසේම **යෝජනාවලිය** ඉදිරිපත් කරන ආයතනය

- නිර්මාණාත්මක (Creative)
- උපායශීලී (Strategy)
- සැලසුම්සහගත මාධ්‍ය භාවිතය (Media Plan)

කෙරෙහි සැලකිලිමත් වෙමින් යෝජනාවලිය ඉදිරිපත් කල යුතුය.

**2. සම්පූර්ණ මිල ඉදිරිපත් කිරිම (ලබා දී ඇති මිල කැඳවීමේ පත්‍රිකාවට අනුව)**

**3. ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ලබාදී ඇති ලංසු ලේඛණයේ සියලු උපදෙස් සහ කොන්දේසි පිලිපැදීමට එකඟත්වය ප්‍රකාශ කිරීමේ ලිපියක්**

**4.** අදාළ ආයතනයේ කාර්ය දර්ශකය **(Profile)**

**5.** අදාළ ආයතනයේ ජීව දත්ත විස්තර **(කාර්ය මණ්ඩලයේ)**

**6.** ව්‍යාපාර ලියාපදිංචිය **(පිටපත් ඇමිණිය යුතුය.)**



READ ONLY

**7.** වැට් ලියාපදිංචි සහතිකය **(පිටපත් ඇමිණිය යුතුය.)**

**8. ප්‍රවාරණ ආයතනයක් ලෙස අදාළ ක්ෂේත්‍රය පළ පුරුද්ද, අදාළ සහතිකවල පිටපත්, ආයතන ලිඛිතව ඇමිණිය යුතුය.**

**9. පසුගිය වසර 03ක වාර්ෂික පිරිවැටුම සනාථ කෙරෙන ලියවිලි ඇමිණිය යුතුය.**

**10.** අදාල අයදුම්පත 2025 /02/27 දින සිට 2025 /03 /17 දින දක්වා පෙ.ව 10:00 සිට ප.ව. 3.00 දක්වා ආපසු නොගෙවනු ලබන රු. 1500.00 මුදලක්, ගෙවීමෙන් ජා.ග.කො.ස. ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක.

<u>ලංසු ඇගයීමේ නිර්නායක</u>

මෙම ලංසු ලේඛණයේ ලබා දී ඇති උපදෙස් මත සහ ලබා දී ඇති කොන්දේසි වලට එකඟතාවය පල කරන සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත වැඩිම මාසික ගාස්තුවක් ඉදිරිපත් කරනු ලබන ලංසුකරු තෝරාගැනීමට කටයුතු කරනු ලැබේ.

තෝරාගනු ලබන ලංසුකරු පිළිබඳ අවසන් තීරණය ගැනීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු කාර්යයන් වේ.

<u>මිල ගණන් ඉදිරිපත් කිරීම</u>

(දක්වා ඇති උපදෙස් සහ කොන්දේසි සම්පූර්ණ කර ඇති මෙන්ම ජා.ග.කො.සභාව සඳහා වැඩිම මුදල් පිරිනැමීමට යෝජනා කරනු ලබන ආයතන තෝරා ගනු ලැබේ.)



READ ONLY

ඔබ ආයතනය විසින් පහත කාර්යයන් ඉටුකිරීමෙන් අනතුරුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත වෙළඳ ප්‍රචාරණ අයිතය පැවරීමට අදාලව **මාසිකව** ලබාදීමට අපේක්ෂිත මුදල සඳහන් කරන්න.

I. බැස්ටියන් මාවත බස් පර්යන්තයේ ස්ථාපිත විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවේ අධාරක ව්‍යුහය අළුත් වැඩියා කිරීම සහ නව විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවක් ස්ථාපිත කිරීමෙන් අනතුරුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙවීමට අපේක්ෂිත මිල (අකුරින්) රු..............................................................................................................

ඉලක්කමෙන්(රු. ..............................................)

හෝ

II. දැනට ස්ථාපිත අධාරකය සහිත විද්‍යුත් ප්‍රදර්ශණ පුවරුව ගලවා ඉවත් කර නව විද්‍යුත් ප්‍රදර්ශණ පුවරුවක් ස්ථාපිත කිරීමෙන් අනතුරුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙවීමට අපේක්ෂිත මිල (අකුරින්) රු..............................................................................................................

ඉලක්කමෙන්(රු. ..............................................)

ආයතනයේ නම :

ලිපිනය :

දුරකථනය සහ ෆැක්ස් අංකය :

වගකිය යුතු නිලධාරී අත්සන:

නිල මුද්‍රාව :

දිනය:

READ ONLY